# මාධ්‍ය නිවේදනයයි

## පොලිතීන් මගින් ඇති වී තිබෙන පාරිසරික ගැටළු අවම කිරීම සඳහා පොලිතීන් භාවිතය නිසි පරිදි කළමනාකරණය කිරීම

පොලිතීන් භාවිතය නිසි පරිදි කළමනාකරණය කිරීම පිළිබඳව 2016 සැප්තැම්බර් 06 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි පත්කල විද්වත් කමිටුව විසින් පිළියෙල කල ක්‍රියාකාරී සැලැස්ම අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලදුව 2017 ජුලි 11 දින අමාත්‍ය මණ්ඩලය විසින් එය අනුමත කරමින් එම සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ වගකීම මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත පවරා ඇත.

මෙම ක්‍රියාකාරී සැලැස්ම අනුව 2017 සැප්තැම්බර් 01 දින සිට ක්‍රියාත්මක කිරීමට නියමිත ක්‍රියාකාරකම් පහතින් දක්වා ඇත.

1. ජාතික, ආගමික, සාමාජීය, සංස්කෘතික හා දේශපාලන උත්සව ඇතුළු සියලු උත්සවවලදී සැරසිලි සඳහා පොලිතීන් භාවිතය තහනම් කිරීම සහ සැරසිලි කිරීමේදී පරිසර හිතකාමී අමුද්‍රව්‍ය පමණක් භාවිතා කිරීම.

2. 1980 අංක 47 දරණ ජාතික පාරිසරික පනතෙහි ප්‍රතිපාදන වලට අනුව, මයික්‍රෝන 20 ට සමාන හෝ අඩු ඝනකමින් යුතු පොලිතීන් දේශීය භාවිතය සඳහා නිෂ්පාදනය, විකිණීම සහ භාවිතය සම්බන්ධයෙන් වන 2006 ඔක්තෝබර් 10 දිනැති අංක 1466/5 දරණ රෙගුලාසිය තව දුරටත් බලපැවැත්වෙනු ඇත. අත්‍යාවශ්‍ය හා විශේෂ අවස්ථාවන් සඳහා පමණක් මධ්‍යම පරිසර අධිකාරියේ අනුමැතිය මත මයික්‍රෝන 20 ට අඩු ඝණකමින් යුත් පොලිතීන් ආනයනය, නිපදවීම, විකිණීම හා භාවිතය සිදු කල යුතුය.

3. පොලිතීන්වලින් නිෂ්පාදිත, පොදුවේ “ලන්ච් ෂීට්” හඳුන්වනු ලබන දවටන දේශීය භාවිතය සඳහා ආනයනය, නිෂ්පාදනය, විකිණීම හා භාවිතය තහනම් කිරීම.

4. විස්තාරණය කරන ලද පොලිස්ටයිරීන් (Polystyrene) වලින් නිෂ්පාදිත එක්වරක් පමණක් භාවිතා කර ඉවතලන ආහාර ඇසුරුම් පෙට්ටි (Lunch Boxes), පිඟන් ,කෝප්ප සහ හැඳි ඇතුළු අනෙකුත් ද්‍රව්‍ය ශ්‍රී ලංකාව තුළ භාවිතය සඳහා නිෂ්පාදනය, විකිණීම සහ භාවිතය තහනම් කිරීම. අත්‍යාවශ්‍ය සහ විශේෂ අවස්ථාවන් සඳහා නිෂ්පාදනය, විකිණීම හා භාවිතය මධ්‍යම පරිසර අධිකාරියේ අනුමැතිය මත පමණක් සිදුකල යුතුය.

5. භාණ්ඩ මිලදී ගන්නා අවස්ථාවලදී පාරිභෝගිකයන් වෙත බහාලුම් ලෙස ලබාදෙන වැඩි ඝණත්වයෙන් යුතු පොලිතීන් (High Density Polyethylene - HDPE), වලින් නිෂ්පාදිත “සිලි සිලි බෑග්” (Shopping bags) නිෂ්පාදනය, විකිණීම සහ භාවිතය තහනම් වන අතර, එයට විකල්ප වශයෙන් පරිසර හිතකාමී ඇසුරුම් හෝ ජෛවහායනයට ලක්වන ප්ලාස්ටික් ඇසුරුම් පමණක් පාරිභෝගිකයන් වෙත ලබා දිය යුතුය.

6. විවෘත භූමියේ හෝ පරිශ්‍රයන් තුල පොලිතීන් සහ ප්ලාස්ටික් පිළිස්සීම තහනම් කිරීම.

ඉහත සඳහන් අමාත්‍ය මණ්ඩල තීරණයේ සඳහන් නියෝග නියමිත කාල වකවානුව තුළ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන නීති, උපමාන රෙගුලාසි හා උපදෙස් මෙම අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති මධ්‍යම පරිසර අධිකාරිය සහ අනෙකුත් අදාල රාජ්‍ය ආයතන, මෙන්ම පාර්ශවකරුවන්ගේ සම්බන්ධීකරණයෙන් සිදු කිරීමට මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය විසින් කටයුතු කරනු ලැබේ.

මෙම නිවේදනයේ සඳහන් තහනම් කරනු ලබන තෝරාගත් පොලිතීන් නිෂ්පාදනයන් වෙනුවට පරිසර හිතකාමී විකල්ප නිෂ්පාදනය හා භාවිතය දිරිගැන්වීම තුළින් පරිසර සංරක්ෂණ කාර්යය සඳහා සමස්ථ ශ්‍රී ලාංකික ප්‍රජාවගේ සාමූහික දායකත්වය අතිශයින් අගය කරමි.

ලේකම්
මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය